**බැංකු සේවාවන්**

**අමානා බැංකුවේ VISA ඩෙබිට් කාඩ්පත්**

| | |
|---|---|
| අමානා බැංකුවේ VISA ඩෙබිට් කාඩ්පත් පිළිබඳව | අමානා බැංකුවේ VISA ඩෙබිට් කාඩ්පත් LankaPay ජාලය හරහා මෙරට ATM යන්ත්‍ර 3,800 කට අධික සංඛ්‍යාවකදී සහ, වෙනත් රටවල් 200 කට අධික සංඛ්‍යාවක ATM යන්ත්‍ර මිලියන 2 කට අධික සංඛ්‍යාවකදී භාවිතා කළ හැකි වේ. එමෙන්ම ලොව පුරා වෙළඳසැල් මිලියනකට අධික සංඛ්‍යාවකදී මෙන්ම අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීමේදී එම කාඩ්පත් භාවිතා කළ හැක. ඕනෑම අමානා බැංකු ශාඛාවකදී VISA ඩෙබිට් කාඩ්පතක් සඳහා අයදුම් කළ හැකි වේ.<br><br>සාමාන්‍ය ඩෙබිට් කාඩ්පත<br>කාන්තා ඩෙබිට් කාඩ්පත<br>Vantage ඩෙබිට් කාඩ්පත<br>Prestige ඩෙබිට් කාඩ්පත<br><br>• ATM යන්ත්‍ර හරහා දිනකට මුදල් ලබාගැනීමේ සීමාව: රු. 200,000/-<br>• භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී දිනකට අදාළ වන සීමාව: රු. 250,000/-<br>ඩෙබිට් කාඩ්පත් ගාස්තු සඳහා මෙතැන ක්ලික් කරන්න. |
| ඩෙබිට් කාඩ්පත භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු | • අමානා බැංකුවේ VISA ඩෙබිට් කාඩ්පත ඉස්ලාමීය බැංකුකරණ මූලධර්ම අනුව නිකුත් කර ඇති අතර, මෙරටදී හෝ විදේශයන්හිදී කිසිදු අවස්ථාවක තහනම් ගනුදෙනු සඳහා භාවිතා නොකළ යුතුය.<br>• VISA කාඩ්පත් භාවිතා කළ හැකි ඕනෑම ATM යන්ත්‍රයකදී ඔබේ රහස්‍ය අංකය (PIN) යෙදීම මඟින් හෝ 0117 756 777 ක්ෂණික ඇමතුම් අංකයට ඇමතීම මඟින් ඔබගේ ඩෙබිට් කාඩ්පත සක්‍රීය කළ හැකි වේ.<br>• ප්‍රථම වරට කාඩ්පත භාවිතා කරන අවස්ථාවේදීම ඔබට ලබා දී ඇති රහස්‍ය අංකය මාරු කර, ඒ වෙනුවට ඔබ කැමති ඉලක්කම් 4 කින් යුත් රහස් අංකයක් යෙදීම වඩාත් සුදුසුය.<br>• කාඩ්පත නැති වූ හෝ සොරකම් කරන ලද අවස්ථාවකදී එය වංචා සහගත ලෙස භාවිතා කරනු ලැබීම වැළැක්වීම සඳහා වහාම ඒ බව 0117 756 777 ඔස්සේ අපගේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම් දී කාඩ්පත අවහිර කරන්න.<br>• විදේශ රටකදී කාඩ්පත භාවිතා කිරීමට අවශ්‍ය නම් සංචාරය කිරීමට පෙර ඒ බව අපගේ කාඩ්පත් |

| | |
|---|---|
| | මධ්‍යස්ථානය වෙත දැනුම් දෙන්න. ආපසු පැමිණි පසු ආරක්ෂාව සඳහා එය අවලංගු කරන්න.<br>• මාර්ගගත ගෙවීම් සඳහා කාඩ්පත සක්‍රීය කිරීමට සහ සාමාන්‍ය ගෙවීම් සීමාව ඉහළ නංවා ගැනීමට ඔබේ අමානා බැංකු ශාඛාව වෙත පැමිණෙන්න. |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ<br>https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | • සියලුම දීමනා වලංගු වන්නේ අමානා බැංකුවේ ඩෙබිට් කාඩ්පත් හිමියන් සඳහා පමණි.<br>• අදාළ වෙළඳසැලේ අලෙවිය සඳහා ඇති භාණ්ඩවල සත්‍ය මිලගණන්වලට පමණක් වට්ටම් අදාළ වන අතර, තෑගි වවුචර හෝ දැනටමත් වට්ටම් නියම කර ඇති භාණ්ඩ සඳහා මෙම දීමනා වලංගු නොවේ.<br>• මෙම දීමනා වෙනුවට මුදල් ලබාගත නොහැකි අතර, වෙළඳසැල මඟින් පිරිනමන වෙනත් දීමනා හෝ ප්‍රවර්ධන වැඩසටහන් සමඟ එක්කර භාවිතා කළ නොහැක.<br>• පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක ප්‍රවර්ධන වැඩසටහන ඉවත් කරගැනීමට හෝ ඊට අදාළ නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමට, ප්‍රවර්ධන වැඩසටහනේ කාලසීමාව දීර්ඝ කිරීමට හෝ කෙටි කිරීමට සහ/හෝ ප්‍රවර්ධන වැඩසටහන සම්පූර්ණයෙන්ම අවලංගු කිරීමට අමානා බැංකුවට අයිතිය ඇත.<br>• ඩෙබිට් කාඩ්පත් සඳහා පොදුවේ අදාළ වන නියමයන් හා කොන්දේසි එලෙසින්ම බලාත්මකව පවතී.<br>• මෙම ප්‍රවර්ධන වැඩසටහන, අදාළ වෙළඳ ආයතනවල සහ අමානා බැංකුවේ නියමයන් හා කොන්දේසිවලට යටත් වේ.<br>නියමයන් හා කොන්දේසි පිළිබඳව මතභේදයක් පැනනඟින ඕනෑම අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් අදාළ වෙළඳ ආයතනයේ හෝ අමානා බැංකුවේ තීරණය අවසන් තීරණය වේ. |
| මාර්ගගත ගනුදෙනු පහසුකම සඳහා ලියාපදිංචි වීම | ඔබගේ කාඩ්පත මාර්ගගත ගනුදෙනු සඳහා සක්‍රීය කිරීමට ඔබේ මාර්ගගත බැංකුකරණ ගිණුම හරහා අප වෙත පණිවිඩයක් යොමුකරන්න. විස්තර සඳහා පිවිසෙන්න: බැංකුවට පණිවිඩ යොමුකරන ආකාරය<br>නැතිනම්:<br>1. අමුණා ඇති ආකෘතිය අනුව අයදුම් කිරීමේ ලිපියක් යොමුකරන්න.<br>• ලිපියේ ආකෘතිය බාගත කිරීමට මෙතැන ක්ලික් කරන්න.<br>2. බාගත කරගත් ආකෘතියට අදාළ තොරතුරු ඇතුළත් කරන්න.<br>• සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ලබාදීම මඟින් ක්‍රියාවලිය කඩිනම් වේ.<br>• මුද්‍රිත සහ අතින් ලියූ ලිපි භාරගැනේ. |

| | |
|---|---|
| | 3. ඉහත ලිපියට අත්සන් තබා බැංකුව වෙත එවීම මගින් ඔබ පහත සඳහන් දේවල් කියවා අවබෝධ කරගත් බව හැඟවේ.<br>• ඊමේල් සම්බන්ධ වගකීම් මුක්ති වගන්ති. මෙතැන ක්ලික් කරන්න.<br>• බැංකුවේ යාවත්කාලීන කරන ලද පොදු බැංකු සේවා කොන්දේසි. මෙතැන ක්ලික් කරන්න .<br>• මාර්ගගත ගනුදෙනු සඳහා ලියාපදිංචි වීමේ කොන්දේසි. මෙතැන ක්ලික් කරන්න.<br><br>4. ලිපියේ ඡායාරූපයක් හෝ ස්කෑන් පිටපතක් ලබාගෙන එය ebankingcentre@amana.lk වෙත යොමුකරන්න. වැඩිදුර තොරතුරු සඳහා 011 7 756 756 ඔස්සේ අප අමතන්න. |
| ඩෙබිට් කාඩ්පතක් සඳහා අයදුම් කිරීම | 1. අමුණා ඇති ආකෘතිය අනුව අයදුම් කිරීමේ ලිපියක් යොමුකරන්න.<br>• ලිපියේ ආකෘතිය බාගත කිරීමට මෙතැන ක්ලික් කරන්න.<br>2. බාගත කරගත් ආකෘතියට අදාළ තොරතුරු ඇතුළත් කරන්න.<br>• සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ලබාදීම මගින් ක්‍රියාවලිය කඩිනම් වේ.<br>• මුද්‍රිත ලිපි පමණක් භාරගැනේ.<br>3. ඉහත ලිපියට අත්සන් තබා බැංකුව වෙත එවීම මගින් ඔබ පහත සඳහන් දේවල් කියවා අවබෝධ කරගත් බව හැඟවේ.<br>• ඊමේල් සම්බන්ධ වගකීම් මුක්ති වගන්ති. මෙතැන ක්ලික් කරන්න.<br>• බැංකුවේ යාවත්කාලීන කරන ලද පොදු බැංකු සේවා කොන්දේසි. මෙතැන ක්ලික් කරන්න .<br>• මාර්ගගත ගනුදෙනු සඳහා ලියාපදිංචි වීමේ කොන්දේසි. මෙතැන ක්ලික් කරන්න.<br><br>4. ලිපියේ ඡායාරූපයක් හෝ ස්කෑන් පිටපතක් ලබාගෙන එය ebankingcentre@amana.lk වෙත යොමුකරන්න. වැඩිදුර තොරතුරු සඳහා 011 7 756 756 ඔස්සේ අප අමතන්න. |
| ප්‍රතිචාර සහ පැමිණිලි | ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත.<br><br>පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756<br>ඊමේල් : info@amana.lk \| feedback@amana.lk<br><br>ඔබගේ විමසීම් අපගේ වෙබ් අඩවිය හරහා යොමුකරන්න: www.amanabank.lk<br><br>කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මගින් අප වෙත දැනුම් දෙන්න:<br><br>කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ |

| | |
|---|---|
| | අමානා බැංකුව අංක 485, ගාලු පාර, කොළඹ 03<br>ඊමේල්: servicequality@amana.lk |
| | ඉහත සඳහන් ක්‍රම මඟින් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම්, ඔබට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවාව ලබාගත හැක.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පහත දැක්වේ.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන්,<br>අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 04<br>දුරකථන: + 94 11 2595624 ෆැක්ස්: +94 11 2595625<br>වෙබ් අඩවිය: www.financialombudsman.lk |